ගහ කොල රැක නොගත්තොත් පරිසරයට වන බරපතල හානියට අමතරව තව වසර විස්සකින් රටට උවමනා දව ප්‍රමාණයෙන් සියට 80 ක්ම පිටරටින් ගෙන්වීමටද සිදුවන්නේය. කැලෑ රැකගන්නා අතරම වැඩි වැඩියෙන් පැල සිටුවීම හැරෙන්නට මේ මහා ජාතික ආපදාවෙන් ගැලවීමට අන් මගක් නැත.

# පැල සිටුවීමේ දී මෙකෙසට දී හැඟුමින් අනාගිත දෙමු

ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රචාරක නිලධාරි නෝමන් සිරිපාල විසිනි.

ජාතියේ නොයෙක් අන්දමේ පාරිභෝගික අවශ්‍යතාවයන් සපුරාලනු ලබන පැල සිටුවීමේ ව්‍යාපාරයෙන් ලැබෙන ආර්ථික ප්‍රයෝජන රාශියකි.

ගෙඩනැගිලි ඉදි කිරීමටත්, ගෘහ උපකරණ තැනීමටත්, ඉන්දන සඳහාත් අවශ්‍ය කෙරෙන දව ප්‍රමාණය එමගින් සපයා ගත හැකිවීම එක් කරුණකි. දැනටමත්, මේ සඳහා අවශ්‍ය දව ප්‍රමාණය ලබා ගැනීමේ ප්‍රශ්නය ඉතාම උග්‍රව පවතින්නකි. දව සඳහා ඇති ඉල්ලුම පිරිමැසීමට අවශ්‍යකෙරෙන සැපයුම ඉතාම අල්ප වන බැවින් මිල ඉහල ගොස් ඇති අතර, පිට රටවලින් පවා ආනයනය කිරීමට සිදුවී තිබේ. දර සඳහා දව ඝන මීටර 70 ලක්ෂයක්ද, ඉදිකිරීම් හා භාණ්ඩ සෑදීම සඳහා දව ඝන මීටර 8 ලක්ෂ 50 දහසක්ද දැනට වසරකට අවශ්‍ය කෙරේ.

දව පිළිබඳ ජාතික ප්‍රශ්නය උග්‍ර වන්නට පෙර එනම් දව සුලභව තිබූ අවධිවල දී පැල සිටුවීම පිළිබඳ එතරම් උනන්දුවක් නොවිණ. ගෙවතු විශාලව පැවැති මෙම කාලයේ දී ඒවායේ ඉබේට මෙන් පැල වූ කොස්, දෙල්, පොල්, අඹ වැනි ගස් වලින් ඉහත කී පල ප්‍රයෝජන ලබා ගන්නා ලදී.

දෙවැනි කරුණ ආහාර පාන සඳහා අපට අවශ්‍ය කෙරෙන මූලික ද්‍රව්‍ය වලින් වැඩි කොටසක් ගස්වලින් ලබා ගැනීමය. පාරිභෝගික අවශ්‍යතාව ශීඝ්‍ර සපුරා ගැනීමට හැකිතරම් නිශ්පාදනයක් නොමැති බැවින් පොල් මිල ඉහල ගොස් ඇති බව අපි දනිමු. ඉදිකිරීමේ කටයුතු සඳහා පොල් කඳන් භාවිතා කිරීම නිසා වසරක් පාසා අසීමිත පොල් ගස් ප්‍රමාණයක් විනාශයට පත්වන අතර, ඒ ප්‍රමාණයට සරිලන පැල සංඛ්‍යාවක් අලුතෙන් වගා කරනු නොලැබේ. අනෙකුත් ගස් වර්ගවලට අමතරව අපට ආහාර සපයන කොස්, දෙල්, අඹ වැනි ගස් පවා දව සඳහා භාවිතා කරන බැවින් එම ගස් වර්ග ද ඉතාම විශාල වශයෙන් වර්ෂයක් පාසා විනාශයට යමින් පවතී.

## ගසක මහිම

විශාල ගස් වලින් ගහන කැලෑ බිම් හා වනාන්තරද අපගේ පරිසරය සුරකින ස්වභාවික ආරක්ෂකයා ලෙස කටයුතු කිරීම තුන්වැනි කරුණය. කෘෂිකාර්මික සංවර්ධන කටයුතු සඳහා අවශ්‍යවන ජනපද ව්‍යාප්තිය සහ කෘෂිකාර්මික ව්‍යාපාර ව්‍යාප්තියද, ඊට අමතරව ජනගහන ව්‍යාප්තියද හා සමගම දිවයිනේ වන සම්පත ශීඝ්‍ර ලෙස විනාශ වී යයි. දැනට කපා හෙලනු ලබන කැලෑ ප්‍රමාණය වසරකට අක්කර 1,50,000 දක්වා ඉහළ ගොසිනි. මහවැලි සංවර්ධන ව්‍යාපාරය වැනි මහා පරිමාණයේ ජාතික සංවර්ධන යෝජනා ක්‍රම සඳහා විශාල වශයෙන් භූමිය ප්‍රයෝජනයට ගැනෙන විට අනාගතයේ දී ඉතිරි කැලෑ බිම් බොහොමයක්ද හෙළි පෙහෙළි කිරීමට සිදුවනු ඇත.

දැනට සිය වසකට පෙර දී ශ්‍රී ලංකාවේ තිබූ කැලෑ ඉඩම් ප්‍රමාණය මුළු බිම් ප්‍රමාණයෙන් 80% ක් විය. එයින් දැනට ඉතිරිව ඇත්තේ 20%ක් පමණි. මේ තත්ත්වය අඛණ්ඩව පැවතුණහොත් මේ සියවස තුළ දීම ශ්‍රී ලංකාවේ මුළු කැලෑ බිම්

ප්‍රමාණයම හෙළි පෙහෙලි වීමට බැරිකමක් නැත. අලුත්ම සංඛ්‍යා ලේඛන අනුව දිවයිනේ මුළු කැලෑ ප්‍රමාණය අක්කර 40 ලක්ෂය දක්වා දැනට අඩුවී ඇත.

පසුගිය වසරේ දී රජය මගින් දීපව්‍යාප්ත පැල සිටුවීමේ ව්‍යාපාරයක් අරඹනු ලැබුයේ මෙම තත්ත්වය නියම ලෙස අවබෝධ කරගැනීමෙන් පසුවය. කැලෑ සම්පත භූමියේ සීමිත සම්පතක් බවට පත්වීම එක් දිනෙක දී හෝ සතියකදී හෝ වසරකදී හෝ විසඳිය හැකි ප්‍රශ්නයක් නොවේ. අවකාශ ලැබෙන හැකි සෑම අවස්ථාවකදීම ජාතිය හා අනාගත පරපුරද වෙනුවෙන් පැල සිටුවීම අප සැමගේ බලවත් යුතු කමකි. ඉමහත් වගකීමකි.

ගෙවතු වල පැල සිටුවීමේ යෙදෙන අප විසින් විශේෂයෙන් කල්පනාකාරී විය යුතු කරුණු කීපයක් වේ. පැරන්නන් විසින් වැඩි වශයෙන්ම ප්‍රයෝජන ගනු ලැබුයේ විශාල ගෙවතු වල අතරින් පතර ඉබේට පැලවූ ගස් වලිනි. දැනට සීමිත ඉඩ ප්‍රමාණයක් ඇති කුඩා ගෙවතු වල අතරින් පතර ඉබේ ගස් වැඩීමට අනුබල දෙනු නොලැබේ. ගෙවත්තේ ඒ ඒ තැන්වලට ගැලපෙන ගස් වර්ග තෝරාගැනීමට විශේෂයෙන් කල්පනාකාරී විය යුතුය.

### වටිනා ගසක්ම සිටුවන්න

අතිරේක ආහාර හා දැව ලබාදෙන අතරම ගෙවත්තට අලංකාරයක් හා ආලෝකයක්ද ලබා දෙන ගස්වර්ග තෝරා ගැනීම වඩාත් ප්‍රයෝජන වත්ය. එක් එක් වර්ගයක ගස්, ගස වැඩීම සඳහා අවශ්‍ය පරතරයද ඇතිව පේලියකට සිටුවීම සුදුසුය. කොස්, දෙල්, මැංගුස්ටින්, ගොරක, සියඹලා, දූරියන් වැනි අතුපතර දැඩිව විහිදෙමින් උසට වැඩෙන එමෙන්ම කොල ඝනව හා අන්ධකාරවද වැඩෙන ගස් නිවසට ඈතින් ගෙවත්තේ මායිම සඳහා සිටුවීම මැනවි. ගෙවත්ත කුඩා එකක් වන විට විශාල ගස් වැවීම නොහොබී. නිතර ප්‍රයෝජන ලැබෙන පොල් සහ තැඹිලි ගස් කිපයක් සුදුසු තැනෙක සිටුවා ගැනීම ද ගෙවත්ත සඳහා ඉතාම සුදුසුය. ජම්බු, රඹුටන්, පේර, දෙලුම්, දෙහි, දොඩම්, ගස්ලබු, කෙසෙල් වැනි පලතුරු ගස් නිවසට නොදුරින් සිටුවාගැනීමෙන් නිවසට විශේෂ අලංකාරයක් ද ලබා ගත හැකිය.

පොදු උයන් පාසැල් භූමි, පූජනීය ස්ථාන, රජයේ ආයතන සහ ප්‍රධාන මංමාවත් අසල අලංකාරය සඳහා ගස් සිටුවීමේ දී විශේෂයෙන් ම අතිරේක ආහාර ද්‍රව්‍ය සහ වටිනා දැව ලබාදෙන

( 34 පිටුවට )



පාසල් දරුපිරිසක් උපදේශිකාවකගේ උපදෙස් අනුව පැල සිටුවීම ගැන පුහුණුවක් ලබති.

(19 පිටුවෙන්)

ආර්ථිකමය වටිනා කමකින් යුත් ගස් සිටුවීම ජාතික වශයෙන් වැදගත් ක්‍රියාවකි. වර්ෂයකට එක් වරක් පමණක් මල් හටගන්නා දැව වශයෙන් ද වටිනා කමින් අඩු විශාල ලෙස වැඩෙන ගස් වර්ග වැවීමට මේ සුදුසු කාලය නොවන බව කිව යුතුය.

වැඩෙන තුරු රැකගන්න

මල්, සෙවන හා අලංකාරයද බලාපොරොත්තුවෙන් දනට පොදු උද්‍යාන වල වගාකරනු ලබන ගස් වර්ග වෙනුවට නොයෙක් අන්දමේ පලතුරු ගස් වගාකිරීම ප්‍රයෝජනවත්ය. කොහොඹ, නා, නෙල්ලි, කරාබු, සාදික්කා වැනි ගස් පූජනීය ස්ථාන වලට වඩාත් සුදුසුය. අඳුරු පැහැති ලොකු කොල වලින් යුත් විශාල ලෙස වැඩෙන ගස් මංමාවත් දෙපස සිටුවීම සුදුසු නොවේ. කොල වැටීමෙන් මංමාවත් අපිරිසිදු වන අතර, විශාල ලෙස මුල් පැතිරීමෙන් මංමාවත්ද අබලන්වේ. එසේමගස් පෙරළීමෙන් හදිසි අනතුරුද සිදුවන අවස්ථා ඇත.

පසුගිය වසරේ දී අපි පැල සිටුවීමේ ජාතික ව්‍යාපාරයට සහභාගී වූයෙමු. එහෙත් මෙහිදී වඩාත් වැදගත් වන තවත් කරුණක් ඇත. එනම්, සිටුවනු ලැබූ හා සිටුවනු ලබන පැල හොඳින් වැඩෙන තෙක් ආරක්ෂා කර ගැනීමය. එසේ නොකළහොත් මෙම ව්‍යාපාරයේ ප්‍රගතියක් දැකීම වත්, අපේක්ෂිත අරමුණු මුදුන් පත් කර ගැනීමවත් නොහැකි වනු ඇත.

පැල සිටුවීමට පෙර පළමු කොටම, ආර්ථික වැදගත්කම පිළිබඳව අවධානය යොමු කිරීම වඩාත් වැදගත් වන අතර, යටත් පිරිසෙයින් එක් පැලයක් හෝ සිටුවීමෙන් මෙම ජාතික ව්‍යාපාරයට සහාය වීම ජාතියේ යුතුකමක් වන බව කියයුතුය. දුරදිග බලා දන් දන්ම කටයුතු නොකළොත් තව වසර 20 කින්, එනම්, ක්‍රි. ව. 2000 වන විට අපට අවශ්‍ය දැව ප්‍රමාණයෙන් සියට 80 ක් ම පිටරටින් ගෙන්වීමට අපට සිදුවනු ඇත.